


# නිරාෂගේ නිර්මාණ ලෝකය

"සිටිනවා මට මිතුරෙක්
කෙස් ගහක්වත් හිස නො වන
මුස්නයක් වගේ රැවුලක් තිබෙන
පිස්සෙක් වගේ දුටුවම පෙනෙන
දස්කොන් ඇතුළතින් එබෙන"

"කවුරු ගැන ද මේ කියන්නේ ?" පන්හිඳ පණ්ඩිතයෙක් වගේ ඇහුවේ පින්සලගෙන්. පින් දවල්ට බතක් උයාගන්න හාල් ටිකක් ඒදන ගමන්. සෙනසුරාදා දවසක් හන්දා හැම දෙයක් ම ටිකක් පරක්කුයි.

"තව ටිකක් කිව්වනං බලන්න" පින් වැඩේ ටිකකට තියල කන් දිහෙව්වා.

"තිස්සේ ම චිත්‍රපටි බලනා
දුස්ටයට ආදරේ කරනා
ඇස් යොමා තරු ලකුණු සොයනා
කෙස් නැතුව හරි හැඩට අඳිනා"

"අපේ සුමින්ද මල්ලි ගැනවත් ද ? පැන්සල අතුගාන එක නවත්තලා මුස්නය පැත්තක තියන ගමන් ඇහුවා.

"හරියට හරි ! කොහොම ද ටක්කෙටම කිව්වේ ?" පන්ට පුදුමයි.

ඩැන්ඩිනොංවල පදිංචි ධම්මි කටුගම්පොළ අයියගෙයි ප්‍රේමක්කාගෙයි පුතා තමයි සුමින්ද. පන් එක්ක පොත පත වගේම අදහස්, මත, දැණුම හරි හරියට බෙදා හදාගන්න හොඳ පාඨකයෙක්, රසිකයෙක් සුමින්ද.

"මේ බලන්න ;
තිස්සෙ ම කතන්දර කියනා
හුස්මකි හනි හනිකට වැටෙනා
ඔස්සෙකි රෑට නොනිදා
හිස්වන විතෙන් දිනනා" පන් තව කවියක් කියෙව්වා.

"ඔය ටික කලින් කිව්වනං මටත් හිතාගන්න තිබුණා." පින් කිව්වේ අමනාපෙන් වගේ. "කවුද ඉතින් ඔය නිසඳැස් කවි ලිව්වෙ ?"

නිරාෂ මල්ලි ලියලා තියෙන්නෙ. මාතෘකාව "අමුතු මිතුරෙක්". නිරාෂ ගුණසේකර කියලා තියෙන්නේ ලංකාවේ සම්මාන ලබපු තරුණ කවියෙක්. ඒ වගේ ම ගීත රචනා කීපයකටත් ලංකාවෙදි මුල් තැන ලැබිලා තියෙනවා. දැන් ඉන්නෙ අපිත් එක්ක මෙහෙ. සුමින්දගෙන් පන්, පින්, පැන් තුන්කට්ටුව අඳුනාගත්ත හොඳ යාළුවෙක්, රසිකයෙක්, නිර්මාණකරුවෙක් නිරාෂ. මේ අය එක් වුණාම කතාවෙන්නෙ හරි - හරි බර - බර දේවල්. මේ අයගේ සාහිත්‍ය කතාබහට දිළිනි ඊරියවල ලේඛිකාවත් දැන් හවුල්.

"කෙනෙක් තමන්ට දැනෙන දේ නිර්ව්‍යාජව, අවංකව, ඒ හැටියටම නිර්මාණකයට ගත්තම ඒ දේ හරි සුන්දරයි. ඒක කාටත් දැනෙනවා. ඒකට ආය සීමාවල් දාගෙන පණ්ඩිතකම් පෙන්නන්න ගියාම ඒ දේ කිසි රසයක් නැති ඕලාරික නිර්මාණයක් වෙනවා. මේ බලන්න නිසඳැසේ මේ කොටස් ;

"නිස්කාරණේ කල් නො මරන
තිස්සෙ ම පොතක ඇස් දුවන
ලස්සන හදවතකි විඳගෙන
පස්සෙන් පන්නලා පවසන....."

"දිස්නෙකි පුංචි වූ ඇස් කොන
ඉස්සර රුවක් ගැන ම කියවන
විස්තර කතා නැතුව ම
අස්වසම් ඔහේ අහගෙන...."

"නිරාෂ මල්ලිගෙ නිර්මාණ ගැන මොකද හිතන්නේ ? පසුගිය දවස්වල තමුන්නැහේ අතේ තිබුණොත් උන්නැහේගේ කවි පොතක් නේද ?" පැන්, පන්ට සන්නසට ලියන්න හොඳ මාතෘකාවක් මතක් කළා.

"සැබැවින් ම මෙවන් කොළමක කෙටියෙන් සටහන් තැබීම නිරාෂ ගුණසේකර තරුණ කවියාටත් ඔහුගේ නිර්මාණවලටත් කරනා මදිකමක් දෝ යි සිතෙයි." පන් ලියන්න පටන් ගත්තා.

"කෙසේ වුව ද හැඳින්වීමක් ලෙසින් හෝ යමක් ලිවීම කාලීනයැයි සිතෙන්නේ සරු නිර්මාණ පිළිබඳව ඇසීමට, විඳීමට කාලයකින් නොලැබුණු හෙයිනි. වෙසෙසින් ම අප අතර වෙසෙනා සැබෑ නිර්මාණකරුවකු හඳුන්වා දීමේ අවශ්‍යතාවයත් එහි වැදගත්කමත් තදින් ම දැනෙනා නිසාවෙනි. ඒ හඳුනා ගැනීම ඔහුගේ නිර්මාණ කීපයක් තුළින්ම කිරීමට උත්සාහ කරන්නේ, ඔහුගේ දෙවන කාව්‍ය එකතුව වන "හිමි සඳ නැති අඳුර" ග්‍රන්ථයේ නිසඳැස්, කවි, ගී පද ඇසුරෙනි. නිරාෂ මෙම ග්‍රන්ථය "නමස්කාරය" නමින් පිළිගන්වන්නේ දිවංගත ගුණදාස කපුගේ විශාරදවරයාවත්, ප්‍රවීණ ගී පද නිබන්ධක රත්න ශ්‍රී විජේසිංහ කිවිඳාණන්ටත්ය. ඒ මෙසේය ;

"මිනිස් හඬින් හදවත සෙවි
මිතුරාණ
හඬට යටින් පදරුත් පෑ
කවියාණ
ජීවිතයේ හිමි සරතැස
දැණුනාම
නුඹ මැ වුණා මා හිස පිට
සඳපාණ

"වැඩ කරන ජනතා කලා උළෙල - දහදිය සිත්තම" සඳහා වර්ෂ 2007 දී නිරාෂ ඉදිරිපත් කළ "සඳ කිඳුරිය" ගී පද රචනයට එහි ප්‍රථම ස්ථානය ලැබිණ.

"සඳ කිඳුරී එන්න යන්න
ලණු අඹරා ණය ගෙවන්න
ලිය ගී ගායනාවලින් කුස පිරෙන්නෙ නෑ
කොහු මෝලේ බ්‍රහ්මදත්ත කරුණාවක් නෑ ......!

තමන් උපන් පළාතේ හුරු අත්දැකීම් තුලින් ජීවිතයේ යථාර්තය දැකීමට උත්සාහ කරන නිරාෂ යෞවනයා තම නිර්මාණ තුළට උපහාස රසය මුහු කිරීමට ද රුසියෙකු වග පෙනෙයි. ඒ සඳහා ඔහු "බ්‍රහ්මදත්ත" වැනි වචන යොදාගන්නේ "සඳ කිඳුරී" වැනි සෞන්දර්යාත්මක වචන හා සියුම් ලෙස සළසාලමිනි.

"විහඟි" නවක ගීත රචනා තරඟයෙන් 2006 දී ප්‍රථම ස්ථානය දිනාගත් "සියළු දේ අපේය" නිර්මාණය රතු ඉන්දියානු නායක "සියැටෙල්" විසින් පරිසරය පිළිබඳව කළ ප්‍රකට ප්‍රකාශය අනුව ලියැවුණ පද පෙළක් සේ හැඟෙයි;

"මේ ගහ කොළ මගේ ය
මේ මල් පෙති නුඹේ ය
අපි දෙදෙනාට ම බෙදාගන්න ඕනෑ ම ද මලක සුවඳ ?"

"ඉරට පිපෙන සූරිය කත" නමින් අම්මා පිළිබඳව ලියූ පද පෙළෙහි ඇති යෙදුම් අගනේය;

"පුංචි නෙළුම් අප ප්‍රබුදා ගිනි මද්දහනේ
මේ කුලකින් බිමට වඩින රිදී වැස්ස වැන්නේ
හත් ගව් උස වෙහෙර වගේ දුරට රුවට පෙනේ
නෙරියේ බැඳි වෙරළු හිඹුටු සුවඳයි අම්මේ...."

සුපුරුදු උපමා රූපක යොදාගෙන වුවද නිරාෂ සිය පද ගෙත්තම් කරන්නේ නැවුම් රටාවකින්;

"ඉඳුවර පොකුණට කළුවර වැටුණා
බිඟු තුඩු උණුහුම මලකට දැනුණා
සීතල දිය යට ගිනි කැට සඟවා
මැදියම අළුයම කැකුලක් හැඬුවා"

මල, බිඟුන්, පොකුණ වැනි දේ නිරතුරුව අප හට සාහිත්‍යයේ මුණ ගැසෙනා දේ වුවද ඔහු ඒ දේ තමන්ගේ නිර්මාණයකට මුහු කරගැනීමේදී නැවුම් බවක් එක් කරන්නේ ආකර්ශනීය වදන් මෙන් ම යෙදුම් ද ඇසුරෙනි. "සීතල දිය යට ගිනි කැට සඟවා" යන්න "සිසිල ගිනි ගනී" රූපක අනුව අරුත් ගෙනදෙයි. "රෑ කුමාරී" නම් වන පද රචනාවේ ඉතාම ප්‍රබලව මෙවන් යෙදුම් භාවිතා වෙයි.

"අඳුරේ පූදින රෑ කුමාරීයේ" යනුවෙන් නිරාෂ අමතන්නේ වෛශ්‍යාවකටයි. රෑ තුන් යාමයේ ඇයගේ කාර්ය බහුල බව දැනවීමට ඔහු "තේවාව" යන්න යොදාගනියි. ඇයගේ රැකියාවට අනුව අනිවර්යයෙන්ම යෙදිය යුතු කාර්යය පූජ්‍යස්ථානයක අනිවාර්යයෙන් වැයෙන "තේවාවක්" වැන්න. ඇයගේ ජීවනෝපාය වන නිසාවෙන් ම එය ඇයට මඟහැරිය නොහැකි, එමෙන්ම යම් ගෞරවයකින් යුක්තව කළයුතු "රාජකාරියකි".

"රෑ තේවාවේ සුයාමය ද ළඳුනේ ?"

නිරාෂ මෙම පද පෙළ අවසන් කරන්නේ සමාජ අසාධාරණය, විෂමතාව වැනි දේට උපාහාසය මුසු අභියෝගයක් ද කරමින්.

"මල්සර දුනු හී ඇඳ යට මහළු වුණා වේ
ඊ ළඟ පින් කඳටත් දොර හැර පේවෙන්නේ"

ඕනෑම ලේඛකයෙකු, කවියෙකු ප්‍රිය කරන වදන් වෙයි. ඔවුන්ගේ නිර්මාණ තුළට නිරායාසයෙන්ම ඒ වචන නිතර ඇතුලත් වීම පුදුමයක් නොවේ. නිරාෂගේ "තිතක්" වචනයක් එවැන්නක් දෝයි සිතෙයි. ඔහු "අපර්ණා" හි "තරු කිකන් සේ මළානික අහසේ" උපමාවක් ලෙස එය යොදාගෙන ඇති අතර, "ගිනි ඇසක් ළඟ තිතක්" යෙදුමේ එය රූපකයක් ලෙස යොදාගනියි.

"ආදරයේ වැරැද්ද" නම් වන පද රචනාවේ ද අගනා යෙදුම් දැකිය හැකියි:

"සුසුම් මැද්දෙන් පෙමට පෙම් කළ....."



"දෙගුරුන් සිත් බිඳ ආදරේ අදහන්න ආ....."

එහි දෙවන පද පෙළ පුරාම විඳිය හැකි යෙදුම් ගහණය.

"මාළිගාවේ දොරටු සත බිඳ
වාළුකාවේ කඩුළු වැට පැන
විළඳ අතහැර කඳුළු ඇහිඳින්නට ආ
පුංචි සැළලිහිණී......
වරද නුඹෙදැයි තව ම නොම දනිමි"

ගීයකට අවශ්‍ය කරනා ගුණයත්, ධ්වනි පූර්ණ ගුණයක් ඉස්මතු වන සේ සිංහල භාෂාවේ අපූර්වත්වය පෙන්වන සමාන වචන අගේට ගලපා අර්ථ සම්පාදනය කිරීමෙහිලා නිරාෂගේ හැකියාව ඉන් මොනවට දිස්වෙයි.

මෙම පද රචනා එකතුවේ "හිස් කූඩය" නම් වන නිර්මාණය ද අගේ ය.

"සංගිලි පාලමට උඩින්
සුදු ඇඳගෙන කොක්කු ඇදෙනවා
මේ ගඟේ වතුර බොර වුණාට
අපත් එක්ක ගඟත් ගලනවා

වැලි කූඩය අතට අරන්
මල්ලී ගං පතුල සොයනවා
මං පාරුව උඩ හීන කූඩ
අහස උසට අඩුක් කරනවා....."

චිත්ත රූප මවමින් ව්‍යංගාර්ථයෙන් යමක් කීමට නිරාෂ ගන්නා උත්සාහය නිදසුනක් "දූගෙ කඳුළ" පද පෙළින් ගන්නෙමු.

"දෙකම්මුල් වළ ගැහෙන තැන තව
කඳුළු ඉතුරුයි දෝණියේ..."

"කිළිටි අත්" නමින් ලියවුණ පදපෙළහි එන යෙදුමකි මේ.

"පහර කන බෙර හමක් වාගේ
වරිගයේ පව් හිතෙන් තැවෙයි....."

මෙවන් යෙදුම් ඇසුරින් නිරාෂ පාඨක රසික සිතේ ඇති කරවන ආහ්ලාදය ප්‍රශංසනීයයි.

"කඳුළු විසි කරන් ඈතට
සිනා ඇහිඳපන් විගහට
හොඳ ළමයෙක් නුඹට මනාපයි....."

"නම නොදන්න හෙවැනැල්ලක්
මා පසුපස්සෙන් ම යි....."

"හරිම නිහඬයි මගේ අම්මේ
එය ම මහ සද්දෙට ඇසේ......"

"දුම් චිමිනිය උඩින් හිතේ දුම් පිට කරනා.."

"ආදරයේ මුල් පොත කියා දුන්
කුමරු තව ඉස්ටේසමේ...."

නිරාෂ සිය මව ගැන පබැඳුව "මතු බුදුවන ඇසේ" පද පෙළම කියවන්නා සංවේදී කරවන්නකි. නිරාෂ ගුණසේකරගේ තව තවත් නිර්මාණ මෙලෙස විඳිමින් පාඨකයින් හා බෙදා හදා ගැනීමේ මතු බලාපොරොත්තු ඇතිව මෙයි නවතින්නේ ඔහුට සුභාශිංසනය කරමිනි. පන් තිත තිව්වා.




